රාජකීය විද්‍යාලය - කොළඹ 07

Royal College Colombo 07

13 වන ශ්‍රේණිය - දෙවන වාර පරීක්ෂණය -

Grade 13 – Second Term Test –

කාලය පැය 03 කි

# ආර්ථික විද්‍යාව II

උපදෙස්:- 'අ' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද 'ආ' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

**(01)** සම්පත් හිඟකම ඕනෑම ආර්ථිකයකට එකසේ පොදු වේ.

i. සම්පත්වල සාපේක්ෂ හිඟකම හා නිරපේක්ෂ හිඟකම යනු කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 03)

ii. වෙළඳපළ ආර්ථික මූලික තෝරාගැනීම් සඳහා මඟ පෙන්වනු ලබන්නේ මිල යාන්ත්‍රණයයි. මිල යාන්ත්‍රණය යනු කුමක් ද? (ලකුණු 03)

iii. වෙළෙඳපල ආර්ථිකයක් සිය මූලික තේරීම් කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 03)

iv. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇසුරින් ආර්ථික කාර්යක්ෂමතාව පැහැදිලි කරන්න. (ලකුණු 03)

v. පහත දෑ කල්පිත හැකියා මායිමක සලකුණු කරන්න. (ලකුණු 02)

(අ) වර්ෂය ආර්ථික වෘද්ධි වේගය

| වර්ෂය | ආර්ථික වෘද්ධි වේගය |
|---|---|
| 2000 | - |
| 2005 | 2.37% |
| 2010 | 5.82% |


(ආ) අනාගතයේ ඉහළ ආර්ථික වර්ධනයක් අපේක්ෂාවෙන් වර්තමානයේ තේරීම් කරන නිෂ්පාදන ලක්ෂය. (ලකුණු 03)

(ඇ) මන්නාරම් ද්‍රෝණියේ තෙල් නිධි ඇතැයි විශ්වාස කිරීම.

vi. මිශ්‍ර ආර්ථික පද්ධතියක් පවතින රටක අසම ව්‍යාප්ති විෂමතාවන් ඉවත් කිරීම සඳහා රජයකට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග කවරේද? (ලකුණු 03)

www.alsciencepapers.blogspot.com

(02) වෙළඳ පොළේ සහල් සඳහා පවතින ඉල්ලුම හා සැපයුම අනුව තීරණය වී ඇති සමතුලිත මිල හා ප්‍රමාණය පහත දැක්වේ.




i. වෙළෙඳපොළ අනුව තීරණය වී ඇති සහල් මිල පාරිභෝගිකයාට අවාසිදායක යැයි රජයට පෙනීගොස් ඇත. එම සහල් අලෙවිකළ හැකි උපරිම මිල රු. 80 ක් යැයි රජය තීරණය කළේ යැයි සිතමු. රු. 80 මිල යටතේ සපයන සහල් ප්‍රමාණය 800 ක් දක්වා අඩුවේ. රු. 80 ට සහල් මිලදී ගැනීමට අතිරේක පිරිවැයක් දැරීමට සිදු නොවන්නේ නම්,

(අ) පාරිභෝගික අතිරික්තයේ වැඩිවීම
(ආ) නිෂ්පාදන අතිරික්තයේ අහිමිවීම
(ඇ) ආර්ථික ප්‍රතිපත්තිය නිසා අහිමිවූ ආර්ථික අතිරික්තය (ලකුණු 1 x 3 = 03)

ii. බඩ ඉරිඟු සඳහා වෙළෙඳ පොළ ඉල්ලුම් වක්‍රය $Qd = 75 - 2P$ වන අතර සැපයුම් වක්‍රය $Qs = 5 + 2P$ වේ. බඩ ඉරිඟු නිෂ්පාදකයන් දිරිමත් කිරීම සඳහා රජය බඩ ඉරිඟු නිෂ්පාදකයන්ට රු. 5/ ක සහනාධාරයක් ලබාදීමට තීරණය කර ඇත.

(අ) සහනාධාරයෙන් පසු සමතුලිත මිළ හා ප්‍රමාණය කොපමණද? (ලකුණු 02)
(ආ) සහනාධාරයෙන් පසු ගැනුම්කරු ගෙවන මිළ හා සැපයුම්කරු ලබන මිල කවරේද? (ලකුණු 02)
(ඇ) සමතුලිතයෙන් පසු තීරණය වන සමතුලිත මිල හා ප්‍රමාණය කාර්යක්ෂම වන්නේද පැහැදිලි කරන්න. (ලකුණු 03)

iii. බඩ ඉරිඟු නිෂ්පාදකයාට සහනාධාරයක් ලබාදීම වෙනුවට රු. 20 ක සහතික මිලක් නියම කර සහතික මිල හා වෙළඳපොලේ බඩ ඉරිඟු අලෙවි වන මිල අතර වෙනස නිෂ්පාදකයාට රජය ගෙවීමට තීරණය කිරීම.

(අ) ඌණ පූර්ණ ගෙවීම යටතේ රජයට දැරීමට සිදුවන වියදම කොපමණද? (ලකුණු 02)
(ආ) ඌණ පූර්ණ ගෙවීම යටතේ පාරිභෝගික අතිරික්තයේ සහ නිෂ්පාදන අතිරික්තයේ වැඩි වීම වෙන වෙනම ගණනය කරන්න. (ලකුණු 02)
(ඉ) ශුද්ධ සමාජ සුභසාධනයට සිදුවන හානිකර බලපෑම ගණනය කරන්න. (ලකුණු 02)

iv. භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාවය සහ පාරිභෝගික පැහැදම අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 0

www.alsciencepapers.blogspot.com

(03) i. නිම් ඇඳුම් නිෂ්පාදකයකු තමා නිෂ්පාදනය කරන නිම් ඇඳුම් අලෙවි කිරීම තුලින් වර්ෂය තුළ රු. 1400000 ක අයභාරයක උපයා ගෙන ඇත. ඒ සඳහා රෙදි සහ නූල් මිලදී ගැනීම සඳහා රු. 350,000 ක් ද ඇඳුම් මසන අයට වැටුප් ගෙවීම සඳහා රු. 200,000 ක්ද දරණ ලදි. ඇඳුම් මැසීමේ ව්‍යාපාර සඳහා ලබා ගන්නා ලද රු. 600,000 ක ණය මුදල සඳහා මසකට පොළී සඳහා රු. 6000 බැගින් පොළී ගෙවිය යුතුය. නිම් ඇඳුම් ආයතනයේ ජල බිල්පත සඳහා රු. 30,000 ක් ද විදුලි බිල්පත සඳහා රු. 20,000 ක් ද වර්ෂය තුළ දරණ ලදි. නිම් ඇඳුම් නිෂ්පාදකයා පෙර රැකියාවෙන් ඉවත්වීම නිසා රු. 84,000 ක ආදායමක් වර්ෂය තුල අහිමි වී ඇත. නිම් ඇඳුම් ආයතනය පවත්වාගෙන යන ස්ථානය කුලියට දුන්නේනම් රු. 5000 ක මාසික ආදායමක් උපයාගත හැකිව තිබුණි. මහන මැෂින් වල වටිනාකම රු. 400,000 කි. වර්ෂය අවසානයේ වෙළෙඳ පොළ අගය 360,000කි. මැෂින් වල අගයෙන් 10% ක් ක්ෂය කෙරේ. නිම් ඇඳුම් නිෂ්පාදනයේ නිරත නොවී පාවහන් නිෂ්පාදනයේ නිරත වූයේනම් රු. 200,000 ලාභයක් උපයාගත හැකිව තිබුණි.

(අ) ඉහත තොරතුරු උපයෝගි කරගෙන ආර්ථික ලාභය හා ගණකාධිකරණ ලාභය ගණනය කරන්න. (ලකුණු 02)


(ආ) ආර්ථික විද්‍යානුකූලව තීරණ ගැනීමේදී වැදගත් වන්නේ කවර ලාභයක්ද යන්න සඳහන් කර, එයට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 03)

ii. පූර්ණ තරඟකාරී වෙළෙඳපොළ ව්‍යුහයක් ගොඩ නැගෙන්නේ කවර මූලික කොන්දේසි මතද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. නිෂ්පාදකයකු කෙටිකාලයේදී විචල්‍ය සාධකානුපාත නීතියට මුහුණ දෙනු ලබන්නේ ඇයි ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 03)

iv. පූර්ණ තරගකාරී වෙළඳ පොළක කටයුතු කරන නිෂ්පාදන ආයතනයටකට ලාභ උපරිම කරන නිමවුම තීරණය කිරීම සඳහා අනුගමනය කළ හැකි විකල්ප ප්‍රවේශ කවරේද? එම ප්‍රවේශ බන්ධෙන් ලාභ උපරිම කරන නිමවුම තීරණය කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. නිෂ්පාදන ආයතනයක් නිෂ්පාදනය කරන භාණ්ඩයකට අදාල නිෂ්පාදන පිරිවැය හා අදාළ භාණ්ඩය සඳහා වෙළෙඳ පොලේ තීරණය වී ඇති මිල පිළිබඳ තොරතුරු පහත දැක්වේ.




www.alsciencepapers.blogspot.com

පහත සඳහන් එක් එක් අවස්ථාවන්හි දී ආයතනය ලාභ උපරිම කිරීමේ අරමුණ මත ගනු ලබන තීරණ හේතු සහිතව සඳහන් කරන්න.

(අ) භාණ්ඩය සඳහා තීරණය වී ඇති මිල $p_1$ නම්
(ආ) භාණ්ඩය සඳහා තීරණය වී ඇති මිල $p_2$ නම්
(ඇ) භාණ්ඩය සඳහා තීරණය වී ඇති මිල $p_3$ නම්
(ඉ) භාණ්ඩය සඳහා තීරණය වී ඇති මිල $p_4$ නම් (ලකුණු 04)

(04) i. රජයේ මැදිහත් වීමක් නැති වෙළෙඳපොළ ආර්ථිකයක් ව්‍යාපාර චක්‍ර වලට මුහුණ දෙනු ලබන්නේ ඇයිද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමේ දී "සියලුම ඵලදායී ආර්ථික කටයුතු සැළකිල්ලට ගනු ලැබේ" මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. කල්පිත ආර්ථිකයකට අදාළ ජාතික ගිණුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ. (සියලුම සංඛ්‍යා රු. මිලියන වලිනි)

| | |
|---|---|
| සේවා නියුක්ති ආදායම | 8000 |
| සාංගමික ලාභාංශ | 900 |
| ස්වයං රැකියා නියුක්තිකයන්ගේ ආදායම | 2000 |
| ශුද්ධ ආයෝජනය | 250 |
| වක්‍ර බදු | 100 |
| විදේශ සාධක ලැබීම් | 150 |
| සමාගමික ආදායම් බදු | 300 |
| සේවක අර්ථසාධක අරමුදල් හා විශ්‍රාම වැටුප් ආයක මුදල් | 1000 |
| සමාගමික ලාභ | 2000 |
| පෞද්ගලික ආදායම් බදු | 200 |
| කුටුම්භ සංක්‍රාම | 400 |
| දළ ආයෝජනය | 300 |
| සහනාධාර | 60 |
| විදේශ සාධක ගෙවීම් | 200 |
| බදු කුලී ආදායම් | 1000 |
| ශුද්ධ පොලී ආදායම් | 800 |

ඉහත තොරතුරු උපයෝගි කරගෙන පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) ජාතික ආදායම (ලකුණු 02)
(ආ) කුටුම්භ ආදායම (ලකුණු 02)
(ඇ) වැය කළ හැකි කුටුම්භ ආදායම (ලකුණු 02)
(ඉ) දළ දේශීය ආදායම වෙළෙඳ පොළ මිලට (ලකුණු 02)

www.alsciencepapers.blogspot.com

iv. රජයේ සංක්‍රාම වියදම් මගින් ජාතික ආදායමට කරනු ලබන ගුණක බල පෑමට වඩා, රජයේ වියදම් මගින් ඇති කරන ගුණක බලපෑම ප්‍රබල වේ. මෙයට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(05) i. පහත සඳහන් වන්නේ විවෘත ආර්ථිකයකට අදාල සාර්ව ආර්ථික තොරතුරු වේ. සියලුම සංඛ්‍යා රුපියල් මිලියන වලිනි

$C = 150 + .8yd$

$T = 50$

$G = 100$

$I = 100$

$X = 50$

$M = 100$

(අ) සමාහාර ඉල්ලුම් සමීකරණය ගොඩනගන්න. (ලකුණු 02)

(ආ) පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 02)

(ඇ) y = E යටතේ හෝ W = J යටතේ සාර්ව ආර්ථික සමතුලිත වන ආකාරය දක්වන්න. (ලකුණු 03)

(ඉ) රජයේ වියදම් 50% කපා හැරීමට රජය තීරණය කළේ නම් සමතුලිත ජාතික ආදායමට කරනු ලබන බලපෑම සඳහන් කරන්න. (ලකුණු 02)

ii. පහත සඳහන් සිදුවීම් සමාහාර ඉල්ලුමේ කවර සංරචක වලට අයත් වේද?

(අ) පදිංචිය සඳහා නිවසක් ඉදිකිරීම සඳහා දරණ වියදම

(ආ) වරාය සේවා හා රක්ෂණ සේවා අපනයන ආදායම

(ඇ) රටට අවශ්‍ය බණිජ තෙල් ආනයනය

(ඉ) රජයේ සේවකයන් සඳහා වැටුප් ගෙවීම

(ඊ) කුටුම්භයන් නිවසට ගෘහ උපකරණ මිලදී ගැනීම (1 x 5 = 05)

iii. කල්පිත ආර්ථිකයකට අදාල සාර්ව ආර්ථික තොරතුරු කීපයක් පහත දැක්වේ. සියලුම සංඛ්‍යා රු. මිලියන වලිනි.

| | |
|---|---|
| අපනයන (x) | 200 |
| ආනයන (m) | 250 |
| රජයේ මුළු ආදායම | 100 |
| රජයේ වර්තන වියදම | 150 |
| විදේශ සාධක ලැබීම් | 60 |
| විදේශ සාධක ගෙවීම් | 100 |
| විදේශ පෞද්ගලික සංක්‍රාම | 80 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 150 |
| තොග වෙනස්වීම | 50 |

ඉහත තොරතුරු ඇසුරෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) දේශීය ඉතුරුම් (ලකුණු 02)

(ආ) පෞද්ගලික ඉතුරුම් (ලකුණු 02)

(ඇ) ජාතික ඉතුරුම් (ලකුණු 02)

www.alsciencepapers.blogspot.com

## ආ කොටස

(06) i. මතුපිට උද්ධමනය මිනුම හා සසඳන විට මූලික උද්ධමන මිනුම වඩා ප්‍රයෝජනවත් මිනුමක් වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. නව කොළඹ පාරිභෝගික මිල දර්ශකයට වඩා ගම්‍ය මිල දර්ශකය පොදු මිල මට්ටම මැනීම සඳහා වඩා වැදගත් වන්නේ කෙසේදැයි සඳහන් කරන්න. (ලකුණු 04)

iii. මුදල් සැපයුම හා පොදු මිල මට්ටම අතර කවර සම්බන්ධතාවයක් පවතින්නේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. ප්‍රාථමික සංචිත හා ඉපයීමේ වත්කම් වානිජ බැංකුවක එකිනෙකට ගැටෙන අරමුණු ළඟාකර ගැනීමේ දී ක්‍රියා කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. උද්ධමනය මඟින් ආර්ථිකයට ඇතිකළ හැකි අහිතකර ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 04)

(07) කල්පිත ආර්ථිකයක මහ බැංකුව හා වාණිජ බැංකු සතු තොරතුරු ඔබට සපයා ඇත.

| (රුපියල් මිලියන) | |
|---|---|
| සමස්ත ව්‍යවහාර මුදල් | 217 |
| වාණිජ බැංකු වෙත ඇති ව්‍යවහාර මුදල් | 36 |
| මහ බැංකුව වෙත ඇති වාණිජ බැංකු තැන්පතු | 86 |
| මහ බැංකුව වෙත ඇති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු | 20 |
| වාණිජ බැංකු වෙත ඇති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | 122 |
| මහජනයා සතු වාණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු | 1200 |
| මහජනයා සතු විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු | 241 |

i. ඉහත තොරතුරු උපයෝගී කරගෙන පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) පටු මුදල් සැපයුම (ලකුණු 03)

(ආ) පුළුල් මුදල් සැපයුම (ලකුණු 02)

(ඇ) ඒකාබද්ධ මුදල් සැපයුම (ලකුණු 02)

ii. කල්පිත ආර්ථිකයක වාණිජ බැංකු පද්ධතියට අදාළ ඒකාබද්ධ ශේෂ පත්‍රය පහත දැක්වේ. (සියලුම සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

| | | | |
|---|---|---|---|
| තැන්පතු | 20,000 | සංචිත | 2000 |
| | | ණය | 18000 |
| | 20,000 | | 20000 |

www.alsciencepapers.blogspot.com

බැංකු පද්ධතිය තුළ අධි සංචිත නොමැති අවස්ථාවක් ලෙස සලකන්න.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව එක් වාණිජ බැංකුවකට රු. මිලියන 100 ක තිළින පතක් අලෙවි කළේ යැයි උපකල්පනය කරන්න.

(a) තැන්පතු, සංචිත සහ ණය වලට ඇති වන බලපෑම කවරේද? (ලකුණු 02)

(b) එක් වාණිජ බැංකුවක් පිළින පත මිලදී ගැනීමෙන් පසු ඒකාබද්ධ ශේෂ පත්‍රය (ලකුණු 02)

(ආ) ඉහත "අ" කොටසේ සංසිද්ධිය සිදු නොවූයේ යැයි උපකල්පනය කර මහ බැංකුව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 50% කින්, අඩු කළේ යැයි උපකල්පනය කරන්න. ඒ යටතේ අධි සංචිත සම්පූර්ණයෙන්ම ණය දීම සඳහා භාවිතා කළේනම් නව ශේෂ පත්‍රය පිළියෙල කරන්න. (ලකුණු 02)

ii. වාණිජ බැංකු තැන්පතු බහුවිධ ප්‍රසාරණ ආකෘතිය සම්බන්ධ උපකල්පන අතාත්වික වේ. පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළෙහි පොළී අනුපාතය විශාල විචලනයන් ඇති වීම වැලැක්වීම සඳහා මහ බැංකුව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද? (ලකුණු 03)

(08) i. ධන බාහිරතා සහිත නිෂ්පාදන හා පරිභෝජන ක්ෂේත්‍රයන්හි නිමැවුම සහ පරිභෝජනය ධෛර්යමත් කිරීම සඳහා ආණ්ඩුවට ගත හැකි ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. (අ) පහත සඳහන් ලක්ෂණ මත හඳුනාගත හැකි භාණ්ඩ සඳහා උදාහරණ සපයන්න.

(a) පරිභෝජනයේ තරඟකාරීත්වය ඉතා ඉහළ හා පරිභෝජනය සීමා කළ හැකි වීම ඉතා පහළ

(b) පරිභෝජනයේ තරඟකාරීත්වය ඉතා පහළ හා පරිභෝජනය සීමාකළ හැකි වීම ඉතා ඉහළ (ලකුණු 02)

(ආ) පහත සඳහන් යටිතල පහසුකම සඳහා උදාහරණ සපයන්න.

(a) මෘදු සමාජ යටිතල පහසුකම්

(b) දෘඪ ආර්ථික යටිතල පහසුකම් (ලකුණු 02)

iii. ආර්ථිකය තුල යහපත් බදු ක්‍රමයක් පවත්වාගෙන යාම සඳහා අනුගමනය කළ යුතු මූලධර්ම කවරේද? (ලකුණු 04)

iv. බදු පැනවීම මගින් ඇතිවන අධි බදු බර ශූන්‍ය මට්ටමක පවත්වා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. ශ්‍රී ලංකාවේ බදු ක්‍රමයේ පවතින දුර්වලතා කවරේද? (ලකුණු 04)

www.alsciencepapers.blogspot.com

(09) i. කල්පිත ආර්ථිකයක අය වැය ලේඛණය හා සම්බන්ධ තොරතුරු ඔබට සපයා ඇත. (සියලුම සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

| | |
|---|---|
| බදු ආදායම | 779000 |
| පොලී ගෙවීම් | 250,000 |
| වර්තන පැවරුම් සහ සහනාධාර | 190000 |
| බදු නොවන ආදායම | 75000 |
| භාණ්ඩ හා සේවා වියදම් | 378000 |
| ප්‍රදානයන් | 30000 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම | 3680,000 |

ඉහත තොරතුරු උපයෝගී කර ගෙන පහත සඳහන් දෑ ගණනය කරන්න,

(අ) වර්තන ගිණුමේ ශේෂය (ලකුණු 02)

(ආ) සමස්ථ ශේෂය (ලකුණු 02)

(ඇ) ප්‍රාථමික ගිණුමේ ශේෂය (ලකුණු 02)

ii. රජය දේශීය සම්පත් උපයෝගී කරගෙන අයවැය හිඟය මුල්‍යනය කිරීමෙන් ඇතිවිය හැකි ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 04)

iii. (අ) අය වැය හිඟය පියවීම සඳහා උපයෝගී කර ගනු ලබන ප්‍රසාරණාත්මක මූලාශ්‍ර කවරේද? (ලකුණු 02)

(ආ) ප්‍රසාරණාත්මක මූලාශ්‍ර ඔස්සේ අය වැය හිඟය පියවීම නිසා මුල්‍ය ප්‍රසාරණය සිදු වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. බදු අනුකූලතාවය යනු කුමක් දැයි දක්වා බදු අනුකූලතා අනුපාතිකය ගණනය කරන ආකාරය දක්වන්න. (ලකුණු 04)

(10) නවසීලන්තය සහ ඕස්ට්‍රේලියාව යන රටවල් දෙක පානීය ජලය හා දියර කිරි නිෂ්පාදනය කරයි. මෙරටවල් දෙකෙහි ශ්‍රමය සමජාතීය වේ. ඕස්ට්‍රේලියාවේ ශ්‍රම ඒකක මිලියන 50 ක් සිටින අතර නවසීලන්තයේ ශ්‍රම ඒකක මිලියන 100 ක් සිටී. ශ්‍රම ඒකකයකට නිපදවිය හැකි පානීය ජලය හා දියර කිරි ලීටර ප්‍රමාණය පහත දැක්වේ.

| | ඕස්ට්‍රේලියාව | නවසීලන්තය |
|---|---|---|
| පානීය ජලය | 4 | 1 |
| දියර කිරි | 2 | 2 |

i. (අ) පානීය ජලය හා දියර කිරි නිෂ්පාදනය සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි ඇත්තේ කවර රටවලට ද ? (ලකුණු 02)

(ආ) රටවල් දෙකට අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක ගුවමාරු අනුපාත ගණනය කරන්න. (ලකුණු 02)

www.alsciencepapers.blogspot.com

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

## 071 777 4440

Buy Online - www.LOL.lk

• GCE O/L • PAST PAPERS
• GCE A/L • SHORT NOTES



Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00